# ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
## කොළඹ දිස්ත්‍රික්කය

--------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 09 දින නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය

(අ) පහත සඳහන් වටිනාකම් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

i. ලැබිය යුතු පොළී ආදායම රු.162,500 ක්
ii. ලැබිය යුතු කසල ගාස්තු රු.2,299,510 ක්
iii. රජයේ මුද්‍රණ දෙපාර්මේන්තුවට ගෙවිය යුතුව තිබූ රු.1,450,000 ක්

(ආ) වරිපනම් බදු සඳහා ලබා දුන් වට්ටම් රු.10,922,317 ක් සමුච්චිත අරමුදලට හර කිරීම නිසා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාලව ලැබූ පොළී රු.105,711 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම නිසා ආදායම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.225,000 ක දැන්වීම් පුවරු ගාස්තු චෙක්පතක් අගරුවීම වැරදි ලෙස ගිණුම් තැබිම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල් ගිණුම අඩුවෙන් හා ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ගිණුම් තැබිමේ වරද හේතුවෙන් සමුච්චිත අරමුදලෙහි ඌනතාවය රු.89,356,601 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ලැබිය යුතු එකතුකල අගය මත බදු වටිනාකම රු.35,311,735 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) නාගරික සංවර්ධන අරමුදල් තැන්පතු ආයෝජන ගිණුමේ ශේෂය රු.77,618 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) රු.8,000,000 ක ණයහිමි අධි වෙන් කිරීම නිසා ණයහිමි ගිණුම ඉහත වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) රු.1,418,173 ක්වූ කොන්ත්‍රාත්තුවක් වර්ෂය අවසාන වන විටත් ආරම්භ නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් සමුච්චිත අරමුදල අඩුවෙන් හා ණයහිමි ගිණුම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) ගිණුම්වල හෙළිදරව් නොකිරීම
-----------------------------------

අධිකරණයේ විභාග වෙමින් පැවතුණ බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති රු.7,233,710 ක් වූ නඩු 04 ක් හා බාහිර පාර්ශවයන් විසින් මුදල් අයකිරීමේ අරමුණ නොමැතිව වෙනත් සහන අයදිමින් සභාවට එරෙහිව පවරා ඇති නඩු 21 ක් සම්බන්ධයෙන් එහි ස්වභාවය, අවිනිශ්චිත භාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයෙහි හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්
----------------------------

එක් ගිණුම් විෂයයකට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.16,005,426 ක් වූ අතර ඊට අදාල උපයෝගී ලේඛණ / වාර්තා අනුව ශේෂය රු.16,170,927 ක් විය.

1.3.3 නිරවුල් නොකල ශේෂ
--------------------------

(i) ගිණුම් විෂයයන් 03 කට අදාල රු.4,815,154 ක ලැබිය යුතු එකතු ශේෂයක්ද රු.159,761,797ක ණය හිමි ශේෂයක් වර්ෂ ගණනාවක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ii) රු.112,816,867 ක අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂ තුල ස්ථාන මාරු වී ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු.1,867,175ක්, විශ්‍රාම ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු.722,588 ක්, සේවය හැරගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු.725,588 ක් හා හඳුනා නොගත් ණය රු.113,536 ක් දීර්ඝ කාලයක සිට නිරවුල් කරගෙන නොතිබුණි. ඉකුත් වර්ෂය අවසාන දිනට සේවකයන් 104 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,318,895ක මුදලින් කිසිදු මුදලක් ප්‍රවර්තන වර්ෂය තුලදී අයකර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2017 අගෝස්තු 30 දින වන විට විගණන විමසුම් 10 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විගණන විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 170,617,243 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම

විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා රු.51,789,910 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.663,783,644 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.391,162,435 ක් විය**.**

2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.447,139ක් වටිනා අගරු චෙක්පත් 36ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 186 (4) (අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2016 ජනවාරි හිඟ ශේෂය** | **බිල් කිරීම** | තථ්‍ය අයකර ගැනීම | **2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **2015 ජනවාරි හිඟ ශේෂය** | **බිල් කිරීම** | තථ්‍ය අයකර ගැනීම | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | රු.000 | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු000** | **රු.000** |
| වරිපනම් බදු | 98,855 | 219,757 | 144,531 | 95,134 | 84,944 | 207,579 | 193,668 | 98,855 |
| බලපත්‍ර ගාස්තු | - | 4,432 | 4,432 | - | - | 5,690 | 5,690 | - |
| කුලී | 4,128 | 22,905 | 17,996 | 5,093 | 6,291 | 21,793 | 24,003 | 4,081 |
| ව්‍යාපාර බදු | - | 5,017 | 5,017 | - | - | 5,339 | 5,339 | - |

2.3.2 වරිපනම් බදු

2016 වර්ෂය තුල අවස්ථා දෙකකදී රු.1,957,404 ක වරිපනම් බදු කපා හැර තිබු අතර රු.450,637 ක කපා හැරීම් සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.3.3 වෙළඳ බලපත්‍ර

2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාරික ස්ථාන 204 කින් සහ පොදු වෙළඳ සැල් 15 කින් රු.873,570ක වෙළඳ බලපත්‍ර ආදායමක් අයවිය යුතුව තිබුණි.

2.3.4 ව්‍යාපාර බදු

2016 දෙසැම්බර් 31 දිනට ආදායම් කොට්ඨාශ 10 කට අයත් ව්‍යාපාරික ස්ථාන 695 කින් සහ පොදුවෙළඳසැල් 70 කින් රු.1,988,250 ක ව්‍යාපාර බදු ආදායම් අයවිය යුතු ව තිබුණු අතර කොන්ත්‍රාත් ආයතනවලින් ව්‍යාපාර බදු අයකර ගත යුතු වුවත්, සභා බල ප්‍රදේශයට අයත් කොන්ත්‍රාත් ආයතන 08 ක් ව්‍යාපාර බදු ගෙවා නොතිබීම හේතුවෙන් සභාවට රු.24,000 ක ආදායමක් අහිමි වි තිබුණි.

2.3.5 වෙනත් ආදායම්

-------------------

(අ) පරිසර බලපත්‍ර

-----------------

පරිසර බලපත්‍රයේ නියමිත වලංගු කාලය ඉක්ම වූ ව්‍යාපාරික ස්ථාන 33 ක් නැවත බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභාවට රු.132,000 ක් ද පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නමුත් එසේ ලබා නොගත් ව්‍යාපාර 14 කින් රු.56,000 ක් ද සභාවට අහිමි වී තිබුණි.

(ආ) වැලිකඩ ප්ලාසා වෙලඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීම

----------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 30 කින් රු.700,185 ක කඩ කුලියක් අයවිය යුතුව තිබුණු අතර එයින් නොකඩවා මාස 03 කට අධික කාලයක් කුලී මුදල් නොගෙවා තිබූ බදු හිමියන්ගෙන් අයවිය යුතු හිඟ කුලිය රු.282,106 ක් විය.

(ඇ) දැන්වීම් පුවරු ගාස්තු

------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් හඳුනා නොගත් දැන්වීම් පුවරු 26 ක් , බැනර් 5 ක් හා LED පුවරු 1ක් වෙනුවෙන් සභාවට අහිමි වූ ආදායම රු.569,125ක් විය.

2.3.6 අධිභාර

--------

මහා නගර සභා ආඥා පනතේ 252 වන අධිකාරය 261 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද අධිභාර සහතික 14 කට අදාලව 2016 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු අධිභාර වටිනාකම රු.25,550,166 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මුද්‍රණ පිරිවැය රු.2,825,375 ක් වූ "අසිරිමත් කෝට්ටේ" නැමැති ග්‍රන්ථයේ පිටපත් 3229 ක් 2015 වර්ෂයේ සිට ගබඩාවේ තිබෙන්නට හැරීම නිසා මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ පරමාර්ථය ලෙස සභාව විසින් දක්වා තිබූ පරිදි කෝට්ටේ ඓතිහාසික ශ්‍රී විභූතිය රට පුරා පාසැල්, විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම මුළු මහත් පාඨක ජනතාව අතරට ගෙන ගොස් කෝට්ටේ ඓතිහාසික අභිමානය නැවත සිහියට නැගීම සඳහා ඉහත ග්‍රන්ථයේ මුද්‍රණය කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.

(ආ) III පෙළ නුපුහුණු කම්කරු සේවකයකු 2016 අප්‍රේල් 05 දින නාවික හමුදා අත්අඩංගුවට පත්ව ඇති බව වාර්තාවී තිබියදී ඒ පිළිබඳව විමර්ශනයක් නොකර 2016 අප්‍රේල් මාසය වෙනුවෙන් වූ සම්පූර්ණ වැටුප ලෙස රු.31,074 ක් ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුමට බැරකර තිබුණි. බස්නාහිර පළාත් හා රාජ්‍ය සේවා කාර්ය පරිපාටි රීති සංග්‍රහයේ 31 වන වගන්තිය අනුව නාවික හමුදා සේවයෙන් පහ කරනු ලැබ තිබුනු සේවකයෙක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පත්කරනු ලැබීමට නුසුදුස්සෙක් වන බව දැනුවත් කර තිබියදී, නැවත ඔහු 2016 මැයි 24 දින සිට 2016 ජුනි 23 දින දක්වා සේවය කිරීම වෙනුවෙන් වැටුප් ලෙස නිසි අනුමැතියකින් තොරව රු.31,174 ක් ගෙවා තිබුණි.

(ඇ) වැලිකඩ පොලිසිය අසල ඉඩමේ ඉදිකිරීමට යෝජිත සභා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගෘහ නිර්මාණ සහ උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2015 හා 2016 වර්ෂ වල රු.23,158,753 ක මුදලක් ගෙවා තිබූ අතර රු.16,924,563 ක් වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් කර තිබුණි. නමුත් ඉහත ගොඩනැගිල්ල එම භූමියේ ඉදි නොකර දැනට සභා ගොඩනැගිල්ල ඇති භූමියේම ඉදිකිරීමට 2015 මැයි 07 දින පැවති මහා සභාව විසින් තීරණය කර තිබීම නිසා ඉහත පරිදි වැයකර තිබූ රු. 23,158,753 ක මුදල අනාර්ථික වී තිබුණි.

3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
--------------------------------

(අ) සභාවේ 2016 පෙබරවාරි 25 දින සභාවෙන් පිටත සේවා ස්ථානයකට ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකු සභාවට අයත් රාජගිරිය උද්‍යානයේ පිහිටි අංක 615/3 දරන නිල නිවාසය සභාව වෙත භාර දී නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි රියදුරෙකු, 2016 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා බස්නාහිර ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර එම **කාල** පරිච්ඡේදයට අදාලව වැටුප් හා අතිකාල ලෙස රු.205,507 ක මුදලක් නගර සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු
---------------------------

රාජගිරිය " ජනජය " සිටි නව වෙළඳ සංකීර්ණය සඳහා නගර සභා භූමියේ ඉදිකිරීමට යෝජිත රථගාල, ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, ඒ සඳහා ටෙන්ඩර් ප්‍රචාරණයට දරන ලද රු.74,370ක මුදල ආර්ථික බවෙන් තොර ගනුදෙනුවක් බවට පත්ව තිබුණි.

3.4 නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්
------------------------------------------

(අ) වටිනාකම රු.17,673,035 ක අක්‍රිය වාහන 07 ක් මාස 06 සිට වසර 3 දක්වා කාල පරාසයක් අළුත්වැඩියා කර නොතිබුණි.

(ආ) රු.8,692,020 ක අබලි වාහන 03ක් අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2014, 2015 වර්ෂවල මිලදී ගනු ලැබූ වටිනාකම රු.101,025 ක් වූ තීන්ත තොගයක් අභාවිතව පැවතුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) 2016 පෙබරවාරි 15 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භකර තිබූ කොන්ත්‍රාත් පිරිවැය රු.619,276,616ක්වූ ජයරජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය මාස 18ක් තුල අවසන් කළ යුතු වුවද 2017 සැප්තැම්බර් වන විටත් අවසන් කර නොතිබුණි. ව්‍යාපෘතිය ඉදිකිරීමේ අතරතුර හා ඉන්පසු ගෙවිය යුතු උපදේශක ගාස්තුව මුළු උපදේශක ගාස්තු වටිනාකමින් සියයට 32 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපදේශක ගාස්තු ලෙස ගිවිසුම්ගත ගෙවීම් ප්‍රතිශතය ඉක්මවා සියයට 4 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) අංගම්පිටිය නිවාස සංකීර්ණය ඉදිකිරීම.

-------------------------------------------

අංගම්පිටිය නිවාස සංකීර්ණය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.48,320,909ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ගෙවා තිබුණි. භෞතික පරීක්ෂාව අනුව නිවාස සංකීර්ණයේ ස්ථාන කිහිපයක බිත්ති ඉරිතලා පුපුරාගොස් තිබූ අතර සමස්ථයක් ලෙස ගත්කල මෙම දෙමහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් වල ප්‍රමිතිය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින් මෙම ගොඩනැගිල්ල ගිලා බැසීම නිසා විනාශයට පත් වේය යන මතයක් නේවාසිකයන් තුල ඇතිව තිබුණි.

3.6 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

--------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් වටිනාකම රු.1,687,986,224 වූ ජන ජය සිටි ව්‍යාපෘතිය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු.1,222,886,828 ක් ගෙවා තිබූ අතර ව්‍යාපෘතියේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(I) ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්ගත වීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ මූලික සැලැස්ම විටින් විට වෙනස් කර තිබුණි.

(II) ගොඩනැගිල්ලේ 7 වන මහල මුල් අවස්ථාවේදී කාර්යාල පරිශ්‍රයක් ලෙස පවත්වා ගෙන යාමට තීරණය කර තිබුණ ද පසුව එම මහල පෙර විකුණුම් ක්‍රමයට කඩ කාමර බවට පත්කිරීමට තීරණය කර තිබුණි. නමුත් සභාව එලෙස ගත් මහා සභා තීරණ හා ගිවිසුම් ගත වීමෙන් පසු ගන්නා තීරණ මත ගිවිසගත් මුදලට වන බලපෑම සම්බන්ධයෙන් වන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(III) කොන්ත්‍රාත් ගිවිසුමේ 14.07 කොන්දේසිය ප්‍රකාරව ඉදිරිපත් කරන බිල්පත් සඳහා මුදල් නොගෙවීම මත ප්‍රමාද ගාස්තු ලෙස රු.18,655,727 ක මුදලක් 2017 මැයි 16 වන දින කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් කර තිබුණි.

(IV) ගිවිසුමට අනුව උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීම 2016 ජුලි 23 දින අවසන් කළ යුතු බව ගිවිසගෙන තිබුණද පසුව එම දිනය 2017 ජනවාරි 20 දක්වා දිර්ඝ කර තිබුණි. නමුත් 2017 ජුනි 15 දින තෙක්ම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර නොතිබුණි.

(V) උපදේශක ආයතනය වෙත ගෙවීම් කිරීමේදී සියයට 2 ක රඳවා ගැනීමේ (Completion of post Construction phase) ගාස්තුව වූ රු.1,519,187 ක් අඩුකර නොගෙන සභාව විසින් සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.

(ආ) සභාවට කිසිදු නෛතික හිමිකමක් නොමැති නානායක්කාර මාවතේ පිහිටිඅක්කර 02 රූඩ් 01 පර්චස් 34ක් විශාල රජයට අයත් වගුරු බිමක්ව පැවති ඉඩමක, සභාවේ වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.46,973,078 ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2014 අගෝස්තු 21 දින පවරා තිබුණි. 2015 ජනවාරි 13 දින ගිවිසුම් ගත මුදලින් සියයට 20 ක් ලෙස රු.9,394,616 ක අත්තිකාරමක්ද පළමු කොටස් ගෙවීම ලෙස රු.8,257,371 ක්ද ගෙවා තිබුණි. නමුත් 2015 පෙබරවාරි 02 දින වන විට කල වැඩ වල වටිනාකම රු.11,468,571 ක් වුයෙන් කොන්ත්‍රාත්කරුට රු.5,716,458 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2017 ජුලි 12 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී, පොළොව මතුපිටට නොපෙනෙන අත්තිවාරමක කොන්ක්‍රීට් කනු 42ක් සඳහා කම්බි සිටුවා තිබූ බවත් ඒවා මල බැඳී දිරා යමින් පැවති අතර කොන්ත්‍රාත්කරු වැඩ බිම අතහැර ගොස් තිබූ බවත් ඉදිකිරීම් පරිශ්‍රය කැලයෙන් යටවෙමින් පවතින බවත් අනාවරණය වුයෙන් කර්මාන්තය සඳහා දැනට ගෙවා ඇති රු.17,651,987 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

3.7 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2008 ජුලි 30 දිනැති අංක 1560/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ රීති වල 6 වන පරිච්ඡේදයේ 59 වැනි ඡේදයේ පරිදි සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ මැදිහත්වීම අනුව කාබනික අපද්‍රව්‍ය සඳහා ජීව වායුව කොම්පෝස්ට්කරණය හෝ වෙනත් ප්‍රායෝගික තාක්ෂණික ක්‍රම මගින් සංවිධානය කල යුතු වුවත් සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය කිරීම සඳහා එය සම්පතක් ලෙස යොදා ගැනීමට ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි.

(ආ) නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති හි 2වන පරිච්ඡේදයේ 18 (1) අනුව පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදු වලට අමතරව, කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා ගෘහ මුලිකයා විසින් භාවිත ගාස්තුවක් ගෙවීමට බැඳී සිටින බව සඳහන් වුවත් සභාව විසින් සභා බලප්‍රදේශයේ පිහිටි නිවාස වලින් එවැනි ගාස්තුවක් අයකර නොතිබුණි.

(ඇ) කසළ කළමනාකරණය පිළිබඳ මාසික ප්‍රගති වාර්තා, දිරන හා නොදිරන ලෙස කසළ වෙන්කර එකතු කිරීම පිළිබඳ කාල සටහන් පිළියෙල කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශය 6,7,8,9 හා 10 යන කොට්ඨාශයන්හි කසළ කළමනාකරණ කටයුතු සඳහා 2015 මැයි 01 දින සිට 2017 අප්‍රේල් 30 දක්වා වර්ෂ 02 ක කාලයකට පෞද්ගලික සමාගමකට සමාලෝචිත වර්ෂය තුලදී රු.103,782,886 ක් ගෙවීම් කර තිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව දෛනිකව කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
-------------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

අයවැය හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------

2016 වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2006 මාර්තු 24 දිනැති අයවැය චක්‍රලේඛ අංක 128 ප්‍රකාරව සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 අභ්‍යන්තර විගණනය
----------------------------

ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) තොග පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) අභ්‍යන්තර විගණනය